# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර්/ නොවැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල (නව නිර්දේශය)**

**නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය- SINH 18214**

පළමුවන කොටසේ ප්‍රශ්නයත් දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

### 1 කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් සපයන්න.

උඩහේනේ කඩුල්ල ළඟ, පුංචි අපේ ළිඳ අද්දර
අඹගස්වල මල් පිපිලා කහ රෙද්දක් වනපු ලෙසට
මල්ලන උඳුවප් ඇවිදින් අපෙ ඇඟපත කුද්දන්ට
සඳවතියේ කල් ඇවිදින් නැවුම් පොළොව පූදින්නට

පොළොව හුඟක් නිදා අරන් තකහනියේ ඇහැ ඇරි ලෙස
නිල් තණකොළ පඳුරු ලලා නලියනු දැනුනා දෙපසට
එරබදු දළු මස් පිරිලා මතක් කරා කම්මුල් මට
මේ ඔක්කොම එවා ඇත්තෙ, අපෙ ඇඟපත කුද්දන්න

මගේ තොලුත්, දෙකම්මුලුත්, බඹරුන්මෙහි වැහි මලක් ලෙසට
ඉවසිලි නැති වී වෙවුලයි, ඉමක් නැතිවූ රහ බලන්න
මල්ලන උඳුවප් යනවා, දුරුතු හීතලේ මැරෙන්න
ඊට පළමු ඉඩ දෙන්නකො, නැවුම් පොළොව පූදින්නට

රෑ හඳපානේ ගහ කොළ සිහි නැති වූ කලක් ලෙසට
බලා ඉන්නවා තැවෙමින් මත්වීලා හඳ පානට
හඳපානේ මගෙ ඇඟපත නලියනවා රහ බලන්න
එන්න අනේ සඳවතියේ, හඳපානේ හඳ උරන්න

උඳුවප් මහ හඳපානත්, අඹගස්වල මල් පොකුරුත්
අරන් යනවා දුරුතු මහේ හීතලයේ නිදිකිරන්න
දුරුතු මහේ මගේ ඇඟපත ගුලිවී නින්දට වදින්න
පළමු අනේ ඉඩ හරින්න නැවුම් පොළොව පූදින්නට

### II කොටස

02. ''චරිත නිරූපණයෙහි ලා නවකතා රචකයකු සතු කෞශල්‍යය මගින් ප්‍රබල වූත් අනුස්මරණීය වූත් වින්දනයක් පාඨකයාට ප්‍රදානය කෙරෙයි.'' සනිදර්ශන ව විභාග කරන්න.

03. ''සමකාලීන අවශේෂ නවකතා හා සංසන්දනයේදී චරිත තුනක් වඩාත් සාර්ථක නිර්මාණයක් වශයෙන් ඇගයීමට ලක් වෙයි.'' මෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

04. නූතන සිංහල කෙටිකතා රචකයන් යථාර්ථවත් ප්‍රවේශයකින් විශිෂ්ට නිර්මාණ බිහිකිරීමට දක්වන සාමර්ථ්‍යය, සනිදර්ශන ව විමර්ශනය කරන්න.

05. පහත දැක්වෙන කෙටිකතා අතරින් එකක් පිළිබඳ ව විචාරයක් සපයන්න.

1. වහල්ලු
2. තාත්තා
3. මැයි දිනය
4. වතුර ටැංකිය යට හෙවන
5. කරත්තය

## III කොටස

06. කොළඹ යුගයේ මුල් පරපුරට අයත් කවීන්ගේ පද්‍ය නිර්මාණයන්හි තේමාත්මක විවිධතා කවරේ දැයි සනිදර්ශන ව විභාග කරන්න.

07. මොනිකා රුවන්පතිරණ සිය කාව්‍ය නිර්මාණ මඟින් ස්ත්‍රිය විෂයයෙහි හෙළු ආකල්පය නිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

08. "නාට්‍යය වූ කලී සාමූහික කලාවකි." විමසන්න.

09. මනමේ නාට්‍යය නිර්මාණයේ දී කතුවරයා මූලාශ්‍ර වශයෙන් ගත් ජාතක කථාව අතික්‍රමණය කළ ආකාරය පැහැදිලි කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*********************************